සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය
Sakya Academy of Higher Education Sakya Academy of Higher Education

SAP EXAMINATION FINAL III

සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය
Sakya Academy of Higher Education

# සක්‍යා උසස් පෙළ පෙරහුරු විභාගය 2021
# Sakya Advanced Level Preparatory Examination 2021

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව I<br>Economics I | 21 S I | පැය දෙක යි<br>Two Hours |

**උපදෙස්**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

01. ආර්ථික විද්‍යාවේ දී භූමිය යන්නට නිදසුනක් සපයන්නේ පහත ඒවායින් කවරක් මගින් ද?
(1) කළා වැව
(2) ඇලහැර අමුණ
(3) යෝධ ඇල
(4) නිරිත දිග මෝසම් වැසි
(5) සීගිරිය

02. පහත ඒවායින් යථානුරූපී ප්‍රකාශ සඳහා අදාළ **නොවන්නේ** කවරක් ද?
(1) එය පරීක්ෂා කරන ලද කල්පිතයක් වීම.
(2) එය සාක්ෂි මත පදනම් ව සත්‍යාපනය කළ හැකි ප්‍රකාශනයක් වීම.
(3) එය පුද්ගල හැසිරීම නිරූපණය කරන විද්‍යාත්මක ප්‍රකාශනයක් වීම.
(4) එය විෂයානුබද්ධ ව ඉදිරිපත් කරන ලද්දක් වීම.
(5) එය පුද්ගල අභිරුචියෙන් නිරූපණය කරන විනිශ්චයක් වීම.

03. සමාජයක් සම්පත් හිඟකම පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දෙන විට,
(1) සෑම භාණ්ඩයක් ම පරිභෝජනය කිරීම සඳහා මිලක් ගෙවීමට සිදුවෙනු ඇත.
(2) දිළිඳුකම ලෝකයෙන් තුරන් කිරීමට නො හැකිවනු ඇත.
(3) වුවමනා කිසිවක් සපුරා ගැනීමට නො හැකිවනු ඇත.
(4) එම සමාජය හමුවේ මූලික ආර්ථික ප්‍රශ්න පැන නැගෙනු ඇත.
(5) එම රටවල, නිෂ්පාදන මට්ටම නිෂ්පාදන හැකියා වක්‍රය ඇතුළත ලක්ෂ්‍යයක කටයුතු කරනු ඇත.

04. විධාන ආර්ථික පද්ධති සමඟ සාපේක්ෂ ව බලන කළ වෙළෙඳ පොළ ආර්ථික පද්ධතියක දක්නට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** වනුයේ,
(1) ස්වාර්ථය හා පෞද්ගලික ව්‍යවසාය ක්‍රමය.
(2) පාරිභෝගික ස්වාධිපත්‍යය හා පෞද්ගලික ව්‍යවසායකත්වය.
(3) ආර්ථික නිදහස හා සම්පත් බෙදාවෙන්කිරීමේ කාර්යක්ෂමතාවය.
(4) ආර්ථික නිදහස හා ස්වාර්ථය.
(5) පෞද්ගලික දේපොළ හිමිකම හා පෞද්ගලික ව්‍යවසායකත්වය.

05. කිසියම් ආර්ථිකයක් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව අත්කර ගෙන සිටින බව හඟවන ප්‍රකාශය කුමක් ද?
(1) ආර්ථිකය සතු සියලු ම සම්පත් නිෂ්පාදන කාර්යයට උපයෝජනය කර ඇති බව ය.
(2) ආර්ථිකය, නිෂ්පාදනයට යොදා ගෙන ඇති සෑම සම්පතක් ම කාර්යක්ෂම ව භාවිත කරන බව ය.
(3) එක් භාණ්ඩයක නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ආවස්ථික පිරිවැයක් දැරීමට සිදු නොවන බව ය.
(4) එක් භාණ්ඩයක නිෂ්පාදනය කැප කරන්නේ නැතිව, තවත් භාණ්ඩයක නිෂ්පාදනය වැඩි කළ නොහැකි බව ය.
(5) ආර්ථිකය තුළ නිපදවන සෑම භාණ්ඩයක ම මිල, ආන්තික පිරිවැයට සමාන (P = MC) වන බව ය.

දෙවෙනි පිටුව බලන්න

06. වෙළෙඳ පොළ ආර්ථිකයක මිල මගින් ඉටු කරනු ලබන කාර්යභාරයක් ලෙස සැලකිය **නොහැක්කේ** කවරක් ද?
(1) විවිධ ක්ෂේත්‍ර අතර සම්පත් බෙදා වෙන් කිරීම.
(2) නිෂ්පාදිතය, කුටුම්බ හා නිෂ්පාදකයන් අතර සලාක කිරීම.
(3) ආර්ථික ඒකක විසින් ගනු ලබන තීරණ සම්බන්ධීකරණය කිරීම.
(4) ස්වාර්ථය පිණිස තීරණ ගන්නා ආර්ථික ඒකක පමණක් බිහි කිරීම.
(5) සාපේක්ෂ ලාභදායී භාණ්ඩ හා සේවා පිළිබඳ තොරතුරු ආර්ථික ඒකක වලට ලබා දීම.

07. 2017 - 2021 කාලය තුළ එක්තරා ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වෙනස් වී ඇති ආකාරය පහතින් දැක් වේ.




මෙම ආර්ථිකය පිළිබඳ ව සපයා ඇති කවර ප්‍රකාශයක් **සාවද්‍ය** වේ ද?
(1) 2017 - 2021 කාලය තුළ රූපවාහිනී යන්ත්‍ර කර්මාන්තයෙන් ටැබ් පරිගණක කර්මාන්තයට සම්පත් විතැන් වී ඇති බව යි.
(2) 2017 - 2021 කාලය තුළ ටැබ් පරිගණක කර්මාන්තයට සිදුකරන විදේශ ආයෝජන වැඩි වී ඇති බව හා රූපවාහිනී යන්ත්‍ර නිපදවන කර්මාන්තයෙන් විදේශ ආයෝජන ඉවත් කරගෙන ඇති බව ය.
(3) මෙම කාලය තුළ ටැබ් පරිගණකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය අඩු වී ඇති බව ය.
(4) මෙම කාලය තුළ රූපවාහිනී යන්ත්‍රයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය වැඩි වී ඇති බව ය.
(5) 2017 දී හා 2021 දී අගයන් දෙකක් යටතේ රූපවාහිනී යන්ත්‍රයක ආවස්ථික පිරිවැය ස්ථාවර බව ය.

08. කෘෂිකාර්මික භාණ්ඩයක වෙළෙඳ පොළ සැපයුම් වක්‍රය දකුණට විතැන්වීමට හේතුවක් වනුයේ පහත කවරක් ද?
(1) එම භාණ්ඩය මත පැනවූ බද්ද වැඩි කිරීම ය.
(2) නිෂ්පාදන ආදේශකවල මිල අඩු වීම ය.
(3) රජය ලබා දෙන පොහොර සහනාධාරය ඉවත් කිරීම ය.
(4) එම භාණ්ඩයේ මිල වැඩි වීම ය.
(5) එම භාණ්ඩයේ මිල අඩු වීම ය.

09. දිළිඳු ජනතාව පරිභෝජනය කරන **සුබෝපභෝගී භාණ්ඩයක** ඉල්ලුම් වක්‍රය පහතින් දැක් වේ.




මෙම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාව හා ආදායම් ඉල්ලුම් නම්‍යතාව පිළිබඳ තොරතුරු නිවැරදි ව දැක්වෙන්නේ,

| | මිල ඉල්ලුම් නම්‍යතාව | ආදායම් ඉල්ලුම් නම්‍යතාව |
|---|---|---|
| (1) | ඍණ. | ඍණ. |
| (2) | ධන. | ධන. |
| (3) | ශූන්‍ය. | ඍණ. |
| (4) | ධන. | ඍණ. |
| (5) | ඍණ. | ධන. |

10. එක්තරා පාරිභෝගික භාණ්ඩයක මිල වෙනස්වන විට පරිභෝජන වියදම වෙනස් වී ඇති ආකාරය පහත වගුව මඟින් නිරූපණය කරයි.

| මිල (රු.) | පරිභෝජන වියදම (රු.) |
|---|---|
| 12 | 600 |
| 15 | 750 |

මිල රු. 15.00 දී මිල ඉල්ලුම් නම්‍යතාවය වනුයේ,

(1) - 1.0 (2) - 0.1 (3) 0.0 (4) - 1.5 (5) - 0.5

11. තරඟකාරී වෙළෙඳ පොළක අලෙවිවන M භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාව හා මිල ඉල්ලුම් නම්‍යතාව යන දෙක ම ඍණ වේ. අන් සාධක ස්ථාවර ව තිබිය දී මෙම භාණ්ඩයේ මිල වැඩි වන විට ඇතිවිය හැකි ප්‍රතිඵලය නිවැරදි ව පෙන්නුම් කරන්නේ කවරක් මඟින් ද ?

(1) ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ. මක්නිසාදයත් ඍණ ආදේශන ප්‍රතිවිපාකය සාපේක්ෂ ව බලවත් බැවිනි.
(2) ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ. මක්නිසාදයත් ඍණ ආදායම් ප්‍රතිවිපාකය සාපේක්ෂ ව බලවත් බැවිනි.
(3) ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ. මක්නිසාදයත් ධන ආදායම් ප්‍රතිවිපාකය සාපේක්ෂ ව බලවත් බැවිනි.
(4) ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ. මක්නිසාදයත් ධන ආදේශන ප්‍රතිවිපාකය සාපේක්ෂ ව බලවත් බැවිනි.
(5) ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ. මක්නිසාදයත් ධන ආදේශන ප්‍රතිවිපාකය සාපේක්ෂ ව බලවත් බැවිනි.

12. තරඟකාරී වෙළෙඳ පොළක අලෙවි වන සාමාන්‍ය භාණ්ඩයක වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වය පහතින් දැක් වේ.




අනෙකුත් කරුණු නො වෙනස් ව තිබිය දී පාරිභෝගික ආදායම **අඩු වීම** හා යෙදවුම් මිල **වැඩි වීම** යන සිදුවීම්වල බලපෑම නිවැරදි ව දක්වා ඇත්තේ,

(1) සමතුලිත ප්‍රමාණය වැඩි වේ. සමතුලිත මිල අඩු වේ.
(2) සමතුලිත ප්‍රමාණය වැඩි වේ. සමතුලිත මිල වෙනස් නො වේ.
(3) සමතුලිත ප්‍රමාණය වැඩි වේ. සමතුලිත මිල වෙනස් වීම අවිනිශ්චිත වේ.
(4) සමතුලිත ප්‍රමාණය අඩු වේ. සමතුලිත මිල වෙනස් වීම අවිනිශ්චිත වේ.
(5) සමතුලිත ප්‍රමාණය අඩු වේ. සමතුලිත මිල වැඩි වේ.

13. කිසියම් භාණ්ඩයක් මත අලෙවි බද්දක් පැනවීම නිසා, නිෂ්පාදක අතිරික්තය අඩු වන ප්‍රමාණයෙන් ම රජයේ බදු ආදායම වැඩි වී ඇත. මෙම භාණ්ඩයේ නම්‍යතාව සම්බන්ධයෙන් පහත සපයා ඇති කවර ප්‍රකාශයක් **නිවැරදි** වේ ද?

(1) ඉල්ලුම පූර්ණ අනම්‍ය වේ.
(2) සැපයුම පූර්ණ අනම්‍ය වේ.
(3) ඉල්ලුම පූර්ණ නම්‍ය වේ.
(4) සැපයුම පූර්ණ නම්‍ය වේ.
(5) ඉල්ලුම හා සැපයුම යන දෙක ම ඒකීය නම්‍ය වේ.

14. නිෂ්පාදන ආයතනයක කෙටි කාලීන සාමාන්‍ය පිරිවැය ඉහළයාම කෙරෙහි බලපාන **තාක්ෂණික** කරුණ තෘප්ත වනුයේ,

(1) නිෂ්පාදනය ප්‍රසාරණය කරන විට, හීනවන පරිමාණානුකූල ඵල ක්‍රියාත්මක වීමත් සමඟ වේ.
(2) ස්ථාවර යෙදවුම් ප්‍රමාණයත් සමඟ භාවිතා කරන විචල්‍ය යෙදවුම් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි කිරීමත් සමඟ වේ.
(3) ස්ථාවර යෙදවුම්වල මිල නො වෙනස් ව තිබිය දී විචල්‍ය යෙදවුම්වල මිල ගණන් අඛණ්ඩ ව වැඩි වීමක් නිසා වේ.
(4) ස්ථාවර යෙදවුම් ප්‍රමාණය සමඟ භාවිතා කරන විචල්‍ය යෙදවුම් ප්‍රමාණය ද නො වෙනස් ව පවත්වා ගැනීම නිසා වේ.
(5) විචල්‍ය යෙදවුම් ප්‍රමාණයට සරිලන පරිදි ස්ථාවර යෙදවුම් ප්‍රමාණය වැඩි කිරීමත් සමඟ වේ.

15. පහත දැක්වෙන ඒවා අතරින් **සාවද්‍ය** ප්‍රකාශනය කුමක් ද?

(1) කෙටි කාලයේ දී නිමැවුම් මට්ටම වැඩිකරන විට සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය හා සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය අතර පරතරය අඩු වේ.
(2) සාමාන්‍ය විචල්‍ය පිරිවැය අවමවන නිමැවුම් මට්ටමට වඩා වැඩි නිමැවුම් මට්ටමක දී සාමාන්‍ය මුළු පිරිවැය අවම වේ.
(3) ආන්තික පිරිවැය අවමවන අවස්ථාවේ දී සාමාන්‍ය විචල්‍ය පිරිවැය, ආන්තික පිරිවැයට සමාන වේ.
(4) ආන්තික පිරිවැය වක්‍රය මගින් මුළු පිරිවැය වක්‍රයේ බෑවුම නිරූපණය වේ.
(5) ආන්තික පිරිවැය වැඩිවන විට ඊට අඩු වේගයෙන් සාමාන්‍ය විචල්‍ය පිරිවැය වැඩි වේ.

16. ඒකාධිකාරී තරඟය හා කතිපයාධිකාරය යන වෙළෙඳ පොළ ව්‍යුහවල ලක්ෂණ පහත වගුවෙන් සන්සන්දනාත්මකව ඉදිරිපත් කරයි. ඒවා අතරින් ඔබට **එකඟ විය නොහැකි** කරුණ වනුයේ,

| | ඒකාධිකාරී තරඟය | කතිපයාධිකාරය |
|---|---|---|
| (1) | ප්‍රවේශය බාධාකාරී නො වේ. | ප්‍රවේශය බාධාකාරී වේ. |
| (2) | නිෂ්පාදිතය ප්‍රභේදිත වේ. | නිෂ්පාදිතය ප්‍රභේදිත හෝ සමජාතීය වේ. |
| (3) | ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් ඇත. | ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් නැත. |
| (4) | ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම් වේ. | ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම් වේ. |
| (5) | තනි ආයතනයක් මිල තීරකයෙකු වේ. | තනි ආයතනයක් මිල තීරකයෙකු වේ. |

17. පූර්ණ තරඟකාරී ආයතනයක් දැනට නිෂ්පාදනය කරනු ලබන ඒකක ප්‍රමාණය යටතේ ආන්තික පිරිවැය, එම භාණ්ඩයේ මිල ට වඩා අඩුවන අතර, සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි ය. මෙම තත්ත්වය තුළ ඔබ **එකඟ නොවන** කරුණ පහත ඒවායින් කුමක් ද?
(1) ස්ථාවර පිරිවැය මුළුමනින් ම පියවා ගෙන ඇති බව ය.
(2) ලාභ උපරිම කර නොගන්නා බව ය.
(3) නිෂ්පාදන මට්ටම වැඩිකරන විට ලාභය තව දුරටත් වැඩි කර ගත හැකි බව ය.
(4) ආර්ථික ලාභය, ගිණුම්කරණ ලාභයට වඩා වැඩි බව ය.
(5) ව්‍යාපාර ආයතනය වසා දැමීමට පෙළඹුමක් නැති බව ය.

18. පූර්ණ තරඟකාරී ආයතනයක කෙටි කාලීන ක්‍රියාකාරීත්වය පහත ප්‍රස්තාරයේ දැක් වේ.




මෙම ආයතනයේ ස්ථාවර පිරිවැය මුළුමනින් ම පියවා ගත හැක්කේ,
(1) $P_1$ මිලේ දී පමණි.
(2) $P_2$ මිලේ දී පමණි.
(3) $P_3$ මිල හෝ ඊට වැඩි ඕනෑම මිලක දී පමණි.
(4) $P_2$ මිල හෝ ඊට වැඩි ඕනෑම මිලක දී පමණි.
(5) $P_1$ මිල හෝ ඊට වැඩි ඕනෑම මිලක දී පමණි.

19. වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය මිනුම් කිරීමේ දී එයට ඇතුළත් කළ යුතු වන්නේ පහත කවරක් ද?
(1) කුටුම්බයක් විසින් සමාගම් කොටස් මිල දී ගැනීම.
(2) ආයෝජකයෙකු රජයේ සුරැකුම්පත් මිල දී ගැනීම.
(3) නිවසේ මෙහෙකරුට වැටුප් ගෙවීම.
(4) කොන්ත්‍රාත්කරුවෙකු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සිමෙන්ති මිල දී ගැනීම.
(5) ව්‍යාපාරිකයෙකු අනාථ නිවාසයකට වියළි ආහාර පරිත්‍යාග කිරීම.

20. පහත දැක්වෙන දෑ වලින් ප්‍රාථමික ආදායමක් ලෙස සැලකිය **නො හැක්කේ** කුමක් ද?
(1) සේවක ආදායම්.
(2) මෙහෙයුම් අතිරික්තය.
(3) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය.
(4) නිෂ්පාදනය හා ආනයන මත බදු.
(5) නිෂ්පාදනය හා ආනයන මත ලබාදෙන සහනාධාරය.

21. කිසියම් වර්ෂ දෙකකට අදාළ ස්ථාවර මිලට දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ පහත සංඛ්‍යාතීන්ගෙන් එළැඹිය හැකි නිගමනය කුමක් ද?

| | 1 වසර | 11 වසර |
|---|---|---|
| පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය (රු. මිලි.) | 120,000 | 100,000 |
| ස්ථාවර මිලට දළ දේශීය නිෂ්පාදිතය (රු. මිලි.) | 100,000 | 80,000 |

(1) අදාළ කාලය තුළ පොදු මිල මට්ටම 25% කින් වැඩි වී ඇති බව යි.
(2) අදාළ කාලය තුළ පොදු මිල මට්ටම 20% කින් වැඩි වී ඇති බව යි.
(3) අදාළ කාලය තුළ පොදු මිල මට්ටම 5% කට වඩා අඩු ප්‍රතිශතයකින් වැඩි වී ඇති බව යි.
(4) අදාළ කාලය තුළ පොදු මිල මට්ටම 5% කට වඩා වැඩි ප්‍රතිශතයකින් වැඩි වී ඇති බව යි.
(5) අදාළ කාලය තුළ පොදු මිල මට්ටමේ කිසිදු වෙනසක් සිදු වී නැති බව යි.

22. දේශීය ඉතුරුම් ගණනය කිරීමට අදාළ **වැරදි** ගණනය කිරීම පහත ඒවායින් කවරක් ද ?
(1) = දළ දේශීය ආයෝජන + ශුද්ධ අපනයන
(2) = වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය - සමස්ත පරිභෝජන වියදම
(3) = දළ දේශීය වියදම + ශුද්ධ අපනයන - සමස්ත පරිභෝජන වියදම
(4) = ජාතික ඉතුරුම් - ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම - ශුද්ධ විදේශ ජංගම සංක්‍රාම
(5) = ජාතික ආදායම - සමස්ත පරිභෝජන වියදම

23. එක්තරා ආර්ථිකයක් සඳහා අදාළ සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දැක් වේ. (සියලු ම සංඛ්‍යා රුපියල් බිලියනවලිනි)

| | |
|---|---|
| ආණ්ඩුවේ මිල දී ගැනීම් | 500 |
| වැටුප් හා ශ්‍රමිකයින්ගේ වෙනත් අතිරේක ආදායම් | 2000 |
| ක්ෂය වීම් | 400 |
| දළ ආයෝජනය | 400 |
| පෞද්ගලික පරිභෝජනය | 2200 |
| ශුද්ධ අපනයන | -50 |
| ශුද්ධ වක්‍ර බදු | 150 |

වෙළෙඳ පොළ මිල යටතේ ශුද්ධ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම,

(1) රුපියල් බිලියන 2650 කි. (2) රුපියල් බිලියන 3050 කි. (3) රුපියල් බිලියන 3150 කි.
(4) රුපියල් බිලියන 3400 කි. (5) රුපියල් බිලියන 4650 කි.

24. එක්තරා ආර්ථිකයක සමාහාර ඉල්ලුම් වක්‍රය කාලයත් සමඟ වෙනස් වී ඇති ආකාරය පහතින් දැක් වේ.




සමාහාර ඉල්ලුම් වක්‍රය $Ad_1 - Ad_2$ දක්වා වෙනස් වීමට බලපෑ කරුණ වන්නේ,

(1) ශුද්ධ ආනයන වැඩි වීම ය. (2) ශුද්ධ බදු වැඩි වීම ය.
(3) ඉතුරුම් වැඩි වීම ය. (4) ආයෝජන වැඩි වීම ය.
(5) පොදු මිල මට්ටම වැඩි වීම ය.

25.




පහත ප්‍රකාශ අතරින් **වැරදි** ප්‍රකාශය,

(1) C සිට D දක්වා කාලය තුළ ආර්ථික ප්‍රසාරණයක් සිදු වී ඇත.

(2) D සිට E දක්වා කාලය තුළ තිරසාර ආර්ථික වෘද්ධියක් සිදු වී ඇත.

(3) A සිට C දක්වා කාලය තුළ ආර්ථික පසුබැසීමක් සිදු වී ඇත.

(4) D සිට F දක්වා කාලය තුළ උද්ධමනාත්මක බලපෑමක් සිදු වී ඇත.

(5) A සිට B දක්වා කාලය තුළ ආර්ථික සංකෝචනයක් සිදු වී ඇත.

26. කල්පිත ආර්ථිකයක සමාහාර වියදම් ශ්‍රිතය $E = 1500 + 0.75Y$ ලෙස ද, පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම රු. බි. 7500 ක් ලෙස ද දී ඇත. පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම අත්කර ගැනීමට,

(1) ආයෝජන රු. බි. 1500 කින් වැඩිකළ යුතු ය.
(2) ආයෝජන රු. බි. 375 කින් වැඩිකළ යුතු ය.
(3) ආයෝජන රු. බි. 500 කින් වැඩිකළ යුතු ය.
(4) ආයෝජන රු. බි. 750 කින් වැඩිකළ යුතු ය.
(5) ආයෝජන රු. බි. 1500 කින් අඩුකළ යුතු ය.

27. එක්තරා ආර්ථිකයක සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය පහත රූප සටහනින් නිරූපණය කරයි.




ඉහත ප්‍රස්තාර සටහනේ A හා B මඟින් නිරූපණය කරනුයේ,

(1) A - උද්ධමනාත්මක නිමැවුම් පරතරය, B - ප්‍රතිගමනාත්මක නිමැවුම් පරතරය.

(2) A - ප්‍රතිගමනාත්මක නිමැවුම් පරතරය, B - උද්ධමනාත්මක නිමැවුම් පරතරය.

(3) A - උද්ධමනාත්මක වියදම් පරතරය, B - ප්‍රතිගමනාත්මක වියදම් පරතරය.

(4) A - ප්‍රතිගමනාත්මක නිමැවුම් පරතරය, B - උද්ධමනාත්මක වියදම් පරතරය.

(5) A - උද්ධමනාත්මක නිමැවුම් පරතරය, B - උද්ධමනාත්මක වියදම් පරතරය.

28. වර්තමානයේ දී, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් ඉලක්කය ලෙස භාවිත කරනුයේ,
(1) බැංකු පොලී අනුපාතික වේ.
(2) බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් පොලී අනුපාතිකය වේ.
(3) $M_{2b}$ - පුළුල් මුදල් සැපයුම වේ.
(4) පදනම් මුදල් තොගය වේ.
(5) මුදල් ගුණකය වේ.

29. නිෂ්පාදකයාගේ මිල දර්ශකය මගින් මිනුම් කරනුයේ,
(1) පාරිභෝගික භාණ්ඩ හා සේවාවල සිල්ලර මිල වේ.
(2) ආනයනය හා අපනයනය කරනු ලබන භාණ්ඩ හා සේවාවල මිල ගණන් වේ.
(3) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන සියලු ම භාණ්ඩ හා සේවාවල මිල ගණන් වේ.
(4) දේශීය නිෂ්පාදකයින්ට තම භාණ්ඩ හා සේවා සඳහා ලැබෙන මිල ගණන් වේ.
(5) දේශීය ව නිපදවන හා ආනයන කරනු ලබන භාණ්ඩවල මිල ගණන් වේ.

30. බොහෝ රටවල මූලික උද්ධමනය මැනීම සඳහා මිල දර්ශකයක් යොදා ගන්නා විට ආහාර හා බලශක්ති වියදම් බැහැර කරනු ලැබේ. එයට හේතුව වන්නේ,
(1) ආහාර හා බලශක්තිය අත්‍යවශ්‍ය භාණ්ඩ වන බැවිනි.
(2) ආහාර හා බලශක්තිය මිල ගණන් ගෝලීය වෙළෙඳ පොළවල් මත තීරණය වන බැවිනි.
(3) ආහාර හා බලශක්ති මිල ගණන්වල උච්ඡාවචන තාවකාලික වන බැවිනි.
(4) ආහාර හා බලශක්තිවල මිල ගණන් අධික උච්ඡාවචනයන්ට පාත්‍ර නොවන බැවිනි.
(5) ආහාර හා බලශක්ති මිල ගණන් පිළිබඳ දත්ත රැස්කිරීම දුෂ්කර බැවිනි.

31. කල්පිත වාණිජ බැංකු පද්ධතියක ශේෂ පත්‍රය පහතින් දැක් වේ.

| | රු. බිලියන | | රු. බිලියන |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 6 000 | සංචිත | 1 500 |
| කොටස් ප්‍රාග්ධනය | 1 000 | ණය හා අත්තිකාරම් | 4 000 |
| ණය ප්‍රාග්ධනය | 500 | භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන | 2 000 |
| | **7 500** | | **7 500** |

බැංකු පද්ධතියේ රු. බි. 300 ක අධි සංචිත පවතී නම් බැංකු පද්ධතියට තවදුරටත් ලබා දිය හැකි ණය ප්‍රමාණය වනුයේ,
(1) රු. බි. 300 (2) රු. බි. 900 (3) රු. බි. 5000
(4) රු. බි. 500 (5) රු. බි. 1 500

32. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තිමය පොලී අනුපාතික ලෙස හඳුන්වන්නේ,
(1) වට්ටම් අනුපාතිකය හා ප්‍රතිවට්ටම් අනුපාතිකය වේ.
(2) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළේ බරතැබූ පොලී අනුපාතිකය වේ.
(3) නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය වේ.
(4) දෛනික වෙන්දේසි ක්‍රමයේ දී භාවිතාවන ප්‍රති මිල දී ගැනුම් හා ප්‍රති විකුණුම් අනුපාතික වේ.
(5) බැංකු පොලී අනුපාතිකය වේ.

33. තෝරාගත් සාර්ව ආර්ථික විචල්‍යන් කිහිපයක අගයන් කිහිපයක් පහත වගුවේ දැක් වේ.

| වර්ෂය | මිල මට්ටම | මුදල් සැපයුම | සංසරණ ප්‍රවේගය | නිමැවුම් ප්‍රමාණය |
|---|---|---|---|---|
| (1) | 120 | 10,000 | 6 | 500 |
| (2) | 144 | 13,200 | 6 | ? |

දෙවන (2) වර්ෂයේ ආර්ථික වර්ධන අනුපාතිකය,
(1) 5% (2) 10% (3) 6% (4) 15% (5) 12%

නමවෙනි පිටුව බලන්න

34. වෙළෙඳ පොළ ආර්ථික පද්ධතියකට කෙරෙන රාජ්‍ය මැදිහත්වීම් කිහිපයක් පහතින් දැක් වේ.

A - දේපොළ හිමිකම තහවුරු කිරීම හා සුරක්ෂිත කර දීම.
B - ශුභ සාධක භාණ්ඩ සැපයීම.
C - තරඟ විරෝධී චර්යා පාලනය කිරීම.
D - බාහිරතා අවම කිරීම.
E - සාර්ව ආර්ථික ස්ථායිතාව ඇති කිරීම.

ඉහත මැදිහත් වීම් අතරින් සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව තහවුරු කිරීමට අදාළ මැදිහත් වීම් නිරූපණය කරනුයේ,

(1) A, C හා E මගිනි. (2) B, C හා D මගිනි.
(3) B, D හා E මගිනි. (4) A, D හා E මගිනි.
(5) B, C හා E මගිනි.

35. තරඟකාරී වෙළෙඳ පොළක අලෙවිවන එක්තරා භාණ්ඩයකට අදාළ සමතුලිත අගයන් පහත ප්‍රස්තාරය නිරූපණය කරයි.




මෙම භාණ්ඩයෙහි පරිභෝජනයේ ධන බාහිරතා පවතී නම් පහත සපයා ඇති කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?

(1) සමාජයීය වශයෙන් ප්‍රශස්ත මිල $P_1$ ට වඩා වැඩිවන අතර හුවමාරු ප්‍රමාණය $Q_1$ ට වඩා අඩු ය.
(2) සමාජයීය වශයෙන් ප්‍රශස්ත මිල $P_1$ ට වඩා වැඩිවන අතර හුවමාරු ප්‍රමාණය $Q_1$ ට වඩා වැඩි ය.
(3) සමාජයීය වශයෙන් ප්‍රශස්ත මිල $P_1$ ට වඩා අඩුවන අතර හුවමාරු ප්‍රමාණය $Q_1$ ට වඩා අඩු ය.
(4) සමාජයීය වශයෙන් ප්‍රශස්ත මිල $P_1$ ට වඩා අඩුවන අතර හුවමාරු ප්‍රමාණය $Q_1$ ට වඩා වැඩි ය.
(5) සමාජයීය වශයෙන් ප්‍රශස්ත මිල $P_1$ වන අතර ප්‍රමාණය $Q_1$ ට වඩා වැඩි ය.

36. ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට රජයක් තීරණය කරනුයේ,
(1) ආර්ථිකයේ නිමැවුම් මට්ටම, පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටමට වඩා වැඩි විට දී ය.
(2) ආර්ථිකයේ නිමැවුම් මට්ටම, පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටමට සමාන විට දී ය.
(3) ආර්ථිකයේ නිමැවුම් මට්ටම, පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටමට වඩා අඩු විට දී ය.
(4) ආර්ථිකයක් පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම අත්කරගත් පසුව, සමාහාර සැපයුම තව දුරටත් ප්‍රසාරණය කළ යුතු විට දී ය.
(5) පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම අඩු කිරීමට තීරණය කළ විට දී ය.

37. පහත දක්වෙන දෑ අතුරින් රටක දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය අඩු වීමට බලපාන සාධකය වන්නේ,
(1) ආර්ථික වර්ධනය අඩු මට්ටමක පැවතීම.
(2) මූර්ත පොලී අනුපාතිකය ඉහළ යාම.
(3) ප්‍රාථමික ගිණුමේ හිඟය පුළුල් වීම.
(4) විදේශ විනිමය අනුපාතිකය ක්ෂය වීම.
(5) උද්ධමන අනුපාතිකය ඉහළ යෑම.

38. කිසියම් රටක් අන්තර්ජාතික වෙළෙඳාමට සම්බන්ධ වී ඇති විට,
   (1) තම රටට අවශ්‍ය සියලු ම භාණ්ඩ හා සේවා එම රට තුළ ම නිෂ්පාදනය කර ගනී.
   (2) තම රටට කාර්යක්ෂම ව නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ හා සේවා පමණක් නිෂ්පාදනය කරනු ලබ යි.
   (3) තම රටට කාර්යක්ෂම ව නිෂ්පාදනය කළ නොහැකි භාණ්ඩ පමණක් ආනයන කරනු ලබ යි.
   (4) තම රටට කාර්යක්ෂම ව නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ අපනයනය කර, කාර්යක්ෂමව නිෂ්පාදනය කළ නොහැකි භාණ්ඩ ආනයනය කරනු ලබ යි.
   (5) තම රටට නිපදවිය හැකි සියලු ම භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර අතිරික්තය අපනයනය කරනු ලබ යි.

39. පහත දක්වෙන්නේ අන්තර්ජාතික වෙළෙඳාමේ ස්වරූප කිහිපය කි.
   A - ඇමරිකා එක්සත් ජනපදය, ජපානයට පරිගණක අපනයනය කර, ජපානයෙන් පරිගණක ආනයනය කරයි.
   B - චීනය, බ්‍රිතාන්‍යයට ජංගම දුරකථන අපනයනය කර, බ්‍රිතාන්‍යයෙන් මෝටර් රථ ආනයනය කරයි.
   C - සෞදි අරාබිය, ඇමරිකාවට තෙල් අපනයනය කර, ඇමරිකාවෙන් ජෙට් යානා ආනයනය කරයි.
   D - ජර්මනිය, ප්‍රංශයට මෝටර් රථ අපනයනය කර ප්‍රංශයෙන් මෝටර් රථ ආනයනය කරයි.

   ඉහත ස්වරූප අතුරින් අත්කරගත් (ගතික) සාපේක්ෂ වාසිය හොඳින් නිරූපණය වන අවස්ථා වනුයේ,

   (1) A හා D මගිනි. (2) B හා C මගිනි. (3) A හා C මගිනි.
   (4) B හා D මගිනි. (5) C හා D මගිනි.

40. දේශීය ව නිපදවනු ලබන සමජාතීය සපත්තු වර්ගයක් ආනයනය කරනු ලබතැයි සිතන්න. මෙම සපත්තු වර්ගය පිළිබඳ පහත විස්තර ඔබට සපයා ඇත.

| | රු. | තීරු බදු ප්‍රතිශතය |
|---|---|---|
| ආනයනික සපත්තු ජෝඩුවක මිල | 1 200 | 25% |
| දේශීය නිෂ්පාදනය සඳහා ආනයන යෙදවුම් | 400 | 25% |

   ආනයන තීරු බදු ප්‍රතිපත්තිය මගින් දේශීය නිෂ්පාදකයාට ලැබෙන සඵල ආරක්ෂණය වනුයේ,
   (1) 37.5 % (2) 25 % (3) 0 % (4) 20 % (5) 50 %

41. ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයෙකු ඇමරිකා එක්සත් ජනපදයේ පේටන්ට් බලපත්‍රයක් මිල දී ගැනීම ගෙවුම් තුලන ලේඛනයේ සටහන් කරනුයේ,
   (1) මූල්‍ය ගිණුම හර, ප්‍රාග්ධන ගිණුම බැර ලෙස ය.
   (2) භාණ්ඩ ගිණුම හර, මූල්‍ය ගිණුම බැර ලෙස ය.
   (3) සේවා ගිණුම හර, මූල්‍ය ගිණුම බැර ලෙස ය.
   (4) ප්‍රාග්ධන ගිණුම හර, ද්විතීයික ආදායම් ගිණුම බැර ලෙස ය.
   (5) ප්‍රාග්ධන ගිණුම හර, මූල්‍ය ගිණුම බැර ලෙස ය.

42. කිසියම් වර්ෂයක් ආරම්භයේ දී එක්සත් ජනපද ඩොලරයක් රුපියල් 100 ක් විය. වර්ෂය අවසාන වන විට එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂ ව රුපියලේ විදේශ අගය 20% කින් ක්ෂය වී ඇත්නම් වසර අවසානයේ දී එක්සත් ජනපද ඩොලරයේ මිල රුපියල් වලින්,

   (1) 25% කින් වැඩි වී ඇත. (2) 20% කින් වැඩි වී ඇත. (3) 25% කින් අඩු වී ඇත.
   (4) 20% කින් අඩු වී ඇත. (5) 10% කින් අඩු වී ඇත.

43. එක්තරා ආර්ථිකයක එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව, ක්‍රයශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය එම රටේ මුදල් ඒකක 25 ක් ද, නාමික විනිමය අනුපාතිකය එම රටේ මුදල් ඒකක 20 ක් ද විය. මින් අදහස් කරන්නේ,
   (1) එම රටේ නාමික විනිමය අනුපාතිකය අධි තක්සේරු වී ඇති  බව හා එමගින් වෙළෙඳ ශේෂය අවාසිදායක වන බව ය.
   (2) එම රටේ නාමික විනිමය අනුපාතිකය ඌන තක්සේරු වී ඇති බව හා එමගින් වෙළෙඳ ශේෂය අවාසිදායක වන බව ය.
   (3) එම රටේ නාමික විනිමය අනුපාතිකය අධිතක්සේරු වී ඇති බව හා එමගින් වෙළෙඳ ශේෂය වාසිදායක වන බව ය.
   (4) එම රටේ නාමික විනිමය අනුපාතිකය ඌන තක්සේරු වී ඇති බව හා වෙළෙඳ ශේෂයට වාසිදායක වන බව ය.
   (5) එම රටේ නාමික විනිමය අනුපාතිකය අධිතක්සේරු වී ඇති බව හා වෙළෙඳ ශේෂයට එයින් කිසිඳු බලපෑමක් ඇති නොවන බව ය.

44. එක්තරා ආර්ථිකයක 2021 වර්ෂයට අදාළව ජංගම ගිණුමේ ඇතුළත් අයිතම පිළිබඳ පහත විස්තර සපයා ඇත.

| | රුපියල් මිලියන |
|---|---|
| භාණ්ඩ අපනයන | 600 |
| භාණ්ඩ ආනයන | 1000 |
| සේවා (ශුද්ධ) | 120 |
| ප්‍රාථමික ආදායම් ලැබීම් | 480 |
| ප්‍රාථමික ආදායම් ගෙවීම් | 600 |
| ද්විතීයික ආදායම් ගිණුමේ ශේෂය | 150 |
| ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) | 20 |

වැරදි හා අත්හැරීම් කිසිවක් **නොපැවතියේ** නම් මූල්‍ය ගිණුමේ ශේෂය,
   (1) රුපියල් මිලියන 230 ක අතිරික්තය කි.
   (2) රුපියල් මිලියන 230 ක හිඟය කි.
   (3) රුපියල් මිලියන 250 ක අතිරික්තය කි.
   (4) රුපියල් මිලියන 250 ක හිඟය කි.
   (5) රුපියල් මිලියන 400 ක හිඟය කි.

45. දරිද්‍රතා ඉම යනු,
   (1) කුටුම්බයකට තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය කරන ආදායම් ප්‍රමාණය යි.
   (2) පුද්ගලයෙකුට දිනකට අවශ්‍ය අවම කැලරි ප්‍රමාණය ලබා ගැනීමට අවශ්‍ය කරන ආදායම් ප්‍රමාණය යි.
   (3) රටක එක් එක් කුටුම්බ හෝ පුද්ගලයන් හිමි කර ගන්නා ආදායම් මට්ටම තුලනාත්මකව විග්‍රහ කිරීම සඳහා යොදා ගන්නා මධ්‍යයන ආදායම් මට්ටම යි.
   (4) කිසියම් පුද්ගලයෙකුට ආදායම් දරිද්‍රතාව, කායික දුබලතා, පීඩනයන්, බෙලහීනතා හා හුදකලාවෙන් තොරව ජීවත් වීම සඳහා අවශ්‍ය ආදායම් මට්ටම යි.
   (5) ලෝක බැංකු වර්ගීකරණයට අනුව පහළ ආදායම් කාණ්ඩයේ සිටින රටකට ඉහළ ආදායම් කාණ්ඩයේ රටක් බවට පත් වීමට අවශ්‍ය කරන අවම ඒක පුද්ගල ආදායම් ප්‍රමාණය යි.

46. මානව සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා **භාවිත නො කරන** උපදර්ශකය  පහත ඒවායින් කවරක් ද?
   (1) උපතේ දී ළදරු මරණ අනුපාතිකය.
   (2) පාසැල් අධ්‍යාපනය ලැබූ සාමාන්‍ය වර්ෂ ගණන.
   (3) ඇමරිකානු ඩොලර්වලින් ප්‍රකාශිත ක්‍රයශක්ති සාම්‍ය ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම.
   (4) උපතේදී ආයු අපේක්ෂණය.
   (5) පාසැල් අධ්‍යාපනය සඳහා ප්‍රවේශවන දරුවකු අධ්‍යාපනයේ නිරත වෙතැයි අපේක්ෂිත සාමාන්‍ය වසර ගණන.

47. කිසියම් රාජ්‍ය වැඩ පිළිවෙළක් යටතේ රටේ පහළ ආදායම් කාණ්ඩවල ජනතාවගේ සාමාන්‍ය ආදායම, ඉහළ ආදායම් කාණ්ඩ වල ජනතාවගේ සාමාන්‍ය ආදායමට සාපේක්ෂව වැඩියෙන් වර්ධනය විය. මෙසේ විය හැක්කේ,
(1) සර්ව සහභාගීත්ව ආර්ථික වෘද්ධි ක්‍රියාවලියක් නිසාවෙනි.
(2) දිළින්දන්ට හිතකර ආර්ථික වෘද්ධි ක්‍රියාවලියක් නිසාවෙනි.
(3) සීඝ්‍ර ආර්ථික වෘද්ධි ක්‍රියාවලියක් නිසා වෙනි.
(4) ආදායම් පුනර්ව්‍යාප්ති ප්‍රතිපත්ති ලිහිල් කිරීම නිසාවෙනි.
(5) වෙළෙඳ පොළ ක්‍රමයක සිට මධ්‍යගත සැලසුම් ක්‍රමයක් කරා ආර්ථිකයක් මෙහෙය වීමෙනි.

48. කල්පිත ආර්ථිකයකට අදාළව ජනගහනය පිළිබඳ තොරතුරු පහත දැක් වේ.

| | |
|---|---|
| වැඩ කරන වයසේ ජනගහනය | 50,000 |
| සේවා නියුක්ත ජන සංඛ්‍යාව | 35,000 |
| ඌන සේවා නියුක්ති ජන සංඛ්‍යාව | 3,500 |
| සේවා වියුක්ත ජන සංඛ්‍යාව | 5,000 |

මෙම ආර්ථිකයේ සේවා වියුක්ති හා ඌන සේවා නියුක්ති අනුපාතික අනුපිළිවෙලින් ප්‍රතිශත ලෙස දක්වා ඇත්තේ,

(1) 10 හා 12.5 කි (2) 10 හා 7 කි (3) 12.5 හා 8.75 කි
(4) 12.5 හා 10 කි (5) 7 හා 10 කි

49. ශ්‍රී ලංකාවේ රසායනික පොහොර සඳහා ඇති මහජන විශ්වාසය අඩුවීම නිසා රසායනික පොහොර සඳහා පවතින ඉල්ලුම සීඝ්‍රලෙස අඩුවීම හේතුවෙන් රසායනික පොහොර කර්මාන්තයේ නියුතු වූ පුද්ගලයින් සැලකිය යුතු පිරිසක් විරැකියාවෙන් පසු වේ යැයි සිතන්න. මෙම තත්ත්වය හඳුන්වනුයේ,

(1) සාර්ෂික සේවා වියුක්තිය ලෙස ය. (2) ඍතුමය සේවා වියුක්තිය ලෙස ය.
(3) සැඟවුණු සේවා වියුක්තිය ලෙස ය. (4) චක්‍රීය සේවා වියුක්තිය ලෙස ය.
(5) ව්‍යුහාත්මක සේවා වියුක්තිය ලෙස ය.

50. පහත දෑ අතුරින් වැරදි සංයෝජනය හඳුනා ගන්න.

| | ලෝරන්ස් වක්‍රය | ගිනි සංගුණකය | ආදායම් විෂමතාව |
|---|---|---|---|
| (1) | සමව්‍යාප්ති රේඛාව මත පිහිට යි. | ශුන්‍ය වේ. | උපරිම වේ. |
| (2) | සමව්‍යාප්ති රේඛාවට ආසන්න වේ. | ශුන්‍යට ආසන්න වේ. | අඩු වේ. |
| (3) | සමව්‍යාප්ති රේඛාවෙන් දුරස් වේ. | එකට ආසන්න වේ. | වැඩි වේ. |
| (4) | සමව්‍යාප්ති රේඛාව මත පිහිට යි. | ශුන්‍ය වේ. | ශුන්‍ය වේ. |
| (5) | සමව්‍යාප්ති රේඛාවෙන් සම්පූර්ණයෙන් ම දුරස් වේ. | එක කි. | උපරිම වේ. |

සැකසුම : බණ්ඩාර දිසානායක
B.Sc.(Mgt)Sp